# කාර්යසාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව-2013

# செயற்திறன் அறிக்கை மற்றும் ஆண்டுக் கணக்குகள் -2013

# Performance Report and Annual Accounts - 2013



## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිළිනොච්චිය

## மாவட்டச் செயலகம் - கிளிநொச்சி

## District Secretariat - Kilinochchi

# කාර්යසාධන වාර්තාව

# 2013

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිළිනොච්චිය

# කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් - 2013

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කිළිනොච්චිය

**පටුන**


| කාර්යසාධන වාර්තාව - 2013 | **පිටුව** |
|---|---|
| 1. දිස්ත්‍රික් ලේකම්තුමියගේ පණිවුඩය | 01 |
| 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හැඳින්වීම | |
| 2.1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම සහ මෙහෙවර | 02 |
| 2.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්යභාරය | 03 |
| 3. දිස්ත්‍රික්කයේ හැඳින්වීම | 05 |
| 3.1 දිස්ත්‍රික්කයේ පරිපාලන සිතියම | 06 |
| 3.2 දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු | 07 |
| 4. ආයතන ව්‍යුහය සහ අනුමත කාර්ය මණ්ඩලය | |
| 4.1 සංවිධාන සිතියම | 08 |
| 4.2 අනුමත කාර්ය මණ්ඩලය | 09 |
| 5. කාර්ය සාධනය | |
| 5.1 රාජ්‍ය පරිපාලන කටයුතු | 11 |
| 5.2 සමාජ සහ සංස්කෘතික කටයුතු | 25 |
| 5.3 සංවර්ධන කටයුතු | 38 |
| 5.3.1.රේඛීය අමාත්‍යාංශ සහ අනෙක් දෙපාර්තමේන්තු | 52 |
| 5.4 ගිණුම් සාරාංශ වාර්තාව | 54 |

## 1.දිසාපතිතුමියගේ පණිවුඩය

දිස්ත්‍රික්කයේ දියුණුව මහජනතාවගේ සේවාවන් හා සංවර්ධන කටයුතුවලින් කඩිනම් දියුණුවෙන් රදා පවතී. මෙම දියුණුව වර්ධනය කිරිමට 2013 වර්ෂය තුළ කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය, රේඛීය අමාත්‍යංශ දෙපාර්තමේන්තු හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල හතර හරහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් ඉටුකර ඇත. ඒ අනුව 2013 වර්ෂය සදහා කාර්ය සාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව සැකසීමේදී ඉමහත් සතුටට පත් වෙමි.

මහා භාණ්ඩාගාරයෙන් කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට වෙන් කරන ලද ප්‍රතිපාදන ජනතාවට විශිෂ්ට සේවාවක් ලබා දීම සදහා ඵලදායී ලෙස යොදා ගෙන ඇත. මේ සදහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමග ප්‍රාදේශිය ලේකම් කාර්යාල, අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු ද සම්බන්ධ වී විශිෂ්ට ලෙස කටයුතු කර ඇත.

විවිධ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු ඔස්සේ වෙන් කරන ලද ප්‍රතිපාදන වැඩසටහන් තුළින් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම වැදගත් කරුණකි· ඒ සදහා සියලු පාර්ශවකරුවන් ඉතා උත්සාහයෙන් කටයුතු කර ඇත. කිලිනොච්චි දිස්ත්‍රික් ජනතාවගේ ජීවන අවශ්‍යතා දියුණු කිරිම සඳහා 2013 වර්ෂයේ දී විවිධාකාරයෙන් සහයෝගය ලබා දුන් අමාත්‍යංශ, දෙපාර්තමේන්තු, ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා අනෙකුත් ආයතනවලට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

රූපවතී කේතීස්වරන් මැතිණිය

දිස්ත්‍රික් ලේකම් /දිසාපති

කිළිනොච්චි දිස්ත්‍රික්කය

## 2.දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හැඳින්වීම

## 2.1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම සහ මෙහෙවර

**දැක්ම**

**"සාර්ථක හා නිවැරදි රාජ්‍ය සේවාවක් ලබා දීම"**

**සේවා අරමුණ**

**"කැපවීම , කැමත්ත, හා අවංක අර්ථවත් සේවාවක් උත්සාහයන් පිරි සේවකයන් හරහා මහජනයාට ලබා දීම තුළින් ඔවුන්ගේ ජීවන තත්වය දියුණු කිරීම"**

## 2.2 . දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු හා කාර්යභාරය

- කාර්යක්ෂමතාවය සඳහා දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය.
- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිපාලන කටයුතු සිදු කිරිම.
- සේවකයින් සම්බන්ධව සියලු කටයුතු සිදු කිරිම.
  (පුද්ගලික ලිපිගොනු, නිවාඩු, වැටුප්, අතිකාල දීමනා, නිවාඩු දින දීමනා, සේවක ගමන් බලපත්‍ර, ණය සහන ........... යනාදිය)

- පොදු ජනතාව සඳහා සේවය ලබා දීම හෝ එකී සේවා අදාල ආයතන වලින් ලබාගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීම.
- ගමන් බලපත්‍ර, හැඳුනුම්පත් ලබා දීම, මෝටර් රථ වාහන බද්ද, ව්‍යාපාර අවසර පත්‍රය, උප්පැන්න, මරණ සහ විවාහ සහතික
- මාර්ග ප්‍රවාහන බලපත්‍ර ලබාදීම.
- රියදුරු බලපත්‍ර ලබාදීම.
- ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම.
- ඉඩම් ඔප්පු සහ බලපත්‍ර ලබාදීම විධිමත් කිරිම සහ ඉඩම් ගැටළු විසඳීම.
- වැඩිහිටි සහ ආබාධිත අය සඳහා මාසික සහනාධාරය
- මහජනතාව සඳහා මානසික සෞඛ්‍ය තත්ත්වය/යහපත් මානසික තත්ත්වයන් නංවාලීම සඳහා කටයුතු කිරිම.
- රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා පුහුණු සහ කාන්තා නායකත්ව පවුල් සඳහා ස්වයං රැකියා පුහුණුව හා දිරිගැන්වීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරමාර්ථයන් ළගාකර ගැනීම පිණිස කාර්යක්ෂම මුල්‍ය ක්‍රමවේදයක් අනුගමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම .

- වාර්ෂික ප්‍රතිපාදන නිසි අධිකාරී බලයකින් හා ගිණුම් තැබීමක් සමඟ කාර්යක්ෂමව යොදා ගැනීම
- සේවකයන් සඳහා අදාල දීමනා ලබාදීම
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුම්වල ඇති මුදල් ප්‍රමාණවත් පාලනයකින් යුක්තව භාවිතා කිරීම
- මාසික, වාර්ෂික වාර්තා නියමිත පරිදි අදාල දෙපාර්තමේන්තුවලට ඉදිරිපත් කිරීම
- විශ්‍රාම වැටුප් ගෙවීම
- දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ලබා ගනු ලබන සේවා සඳහා දීමනා
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම

- දිස්ත්‍රික් කලා සංස්කෘතික කටයුතු හා කාර්යක්ෂමතාවය සඳහා කටයුතු කිරීම සහ මග පෙන්වීම් ලබා දීම
- කලා හා සංස්කෘතික උත්සව පැවැත්වීම සහ දිස්ත්‍රික් හා ජාතික තලයේ වැඩ සටහන්

- දිස්ත්‍රික්කයේ තිබෙන සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරිම සහ ඒ සඳහා සැලසුම් සකස් . කිරීමේ කාර්යයන් දිස්ත්‍රික් සැලසුම් අංශය, ඉඩම් පරිහරණ හා සැලසුම් අංශය ,දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය හා දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය මඟින් ක්‍රියාත්මක කෙරේ.

- **පොදු ජනතාව ආරක්ෂා කිරිම හා මහජනතාව සඳහා අත්‍යවශ්‍ය සේවා ලබා දීම.**
  **රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව දිස්ත්‍රික්කයේ ඇතිවන ආපදා වලදී (ගංවතුර, සුළිසුළං, අධික වර්ෂාව, ඉඩෝරය ) ජනතාව ආරක්ෂා කිරීම.**

- **දිස්ත්‍රික්කයේ සියලු මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු එක්රැස් කිරීම සහ පවත්වාගෙන යෑම මෙය සංඛ්‍යා ලේඛණ අංශය විසින් සිදු කරයි.**

- **දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය හා ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා සැලසුම් සකස් කිරිම හා ක්‍රමවත් කිරීම.**

- මාර්ග සංවර්ධනය, වාරිමාර්ග හා විදුලි පහසුකම් ක්‍රමවත් කිරීම
- විමධ්‍යගත අයවැය මගින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා ලැබෙන මුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම හා අධීක්ෂණය කිරීම.
- රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරිම හා අධික්ෂණය කිරිම. (දිවි නැගුම, ගම නැගුම, මග නැගුම)
- නිවාස ආධාර ලබා දීම .
- යුද්ධයෙන් පීඩාවට පත්වුවන් සඳහා වන්දි ලබාදීම.

## 3.දිස්ත්‍රික්කයේ හැඳින්වීම

යාපනය දිස්ත්‍රික්කය සමග ඒකාබද්ධව තිබූ කිළිනොච්චිය ප්‍රාදේශීය නව දිස්ත්‍රික්කයක් ලෙස 1984 වසරේ පෙබරවාරි මස 04 දින පිහිටුවන ලදී. එහි මායිම්

උතුරට - යාපනය දිස්ත්‍රික්කය

නැගෙනහිරට හා දකුණට - මුලතිව් දිස්ත්‍රික්කය

බටහිරට සහ දකුණට - මන්නාරම දිස්ත්‍රික්කය

ඓතිහාසික වැදගත් ස්ථාන ලෙස උරුත්තිරපුරම් ශිවන් කෝවිල, පුළියම්පොක්කනෙ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෙ සෙන්ට් ඇන්තනීස් පල්ලිය, පාලෛතිවු ශුද්ධ අන්තෝනි පල්ලිය, පොන්නාවෙලි ශිවන් කෝවිල, පූනගරි ඕලන්ද කොටුව ආදිය සැලකේ.ස්වාභාවික සම්පත් වන ඉරණමඩු වැව, සුණ්ඩිකුලම් පක්ෂි උද්‍යානය, කෞදාරිමුනෛ මුහුදු වෙරළ ආදිය මෙහි පිහිටා ඇත.

මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වේ. බොහෝදෙනෙක් වී ගොවිතැනෙහි නිරතව සිටින අතර අනෙක් පිරිස් උප ආහාර භෝග¸ පලතුරු වගා කිරිම¸ සත්ව පාලනය වැනි රැකියාවල යෙදී සිටිති. ඒ සමග ධීවර කර්මාන්තය දෙවැනි ස්ථානය ලගා කරගෙන මෙම ජනතාවගේ ජීවනෝපායට සහය වේ.

ඉරණමඩු වැව ඇතුළු විශාල වැව් අටක් සහ කුඩා වැව් 312 ක් මෙම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. ඒ සමඟ වැසි ජලය බලාපොරාත්තුවෙන්ද ගොවිතැන් කටයුතුවල යෙදේ.

මෑතකාලීන යුද්ධයෙන් මුලුමනින්ම අවතැන් වූ මෙම දිස්ත්‍රික්කයේ ජනතාවගේ නැවත පදිංචි කිරීම 2009 වසරේ දෙසැම්බර් මස සිට ආරම්භ කරන ලදී. දැනට සුලු සංඛ්‍යාවක් හැර සම්පූර්ණයෙන් නැවත පදිංචි කර ඇති බව කිව හැකිය· 2013.12.31 දිනට සිටින ජනගහණ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පිරිමි | කාන්තා | මුළු ජනගහණය |
|---|---|---|---|
| කරච්චි | 33978 | 36454 | 70432 |
| කණ්ඩාවලෛ | 11816 | 12725 | 24541 |
| පූනගරි | 12064 | 12405 | 24469 |
| පච්චිලෛප්පල්ලි | 5849 | 6171 | 12020 |
| එකතුව | 63707 | 67755 | 131462 |

මෙම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වර්ෂාපතනය මිලිමීටර් **1520.57** ක් පමණ වේ. වර්ෂාපතනයෙන් **75%** ක් සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා උතුරු නැගෙනහිර මෝසම් සුළං මගින් ලැබේ. උණුසුම් කාලය ලෙස ජූනි සිට අගෝස්තු මාසය දක්වා සැලකේ. මාසිකව සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක **25** සිට **30** දක්වා වේ.

## 3.1.දිස්ත්‍රික් පරිපාලන සිතියම



## 3.2.දිස්ත්‍රික් මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු

| | |
|---|---|
| දිස්ත්‍රික්කයේ නම | කිළිනොච්චිය |
| පළාත | උතුරු පළාත |
| මුළු භූමි ප්‍රමාණය | වර්ග.කි.මී1237.11 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 04 |
| ග්‍රාම නිළධාරී කොට්ඨාශ සංඛ්‍යාව | 95 |
| ගම් සංඛ්‍යාව | 354 |
| ඡන්ද කොට්ඨාශ සංඛ්‍යාව | 95 |
| මහ නගර සභා සංඛ්‍යාව | -- |
| නගර සභා සංඛ්‍යාව | -- |
| ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 03 |
| අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ලේකම් යටතේ පවතින රජයේ නිල නිවස | 16 |
| කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ගේ සංඛ්‍යාව | 01 |
| පාසල් සංඛ්‍යාව සහ ගුරුවරුන්ගේ සංඛ්‍යාව | 108/1702 |
| පාර්ලිමේන්තු නියෝජිත සංඛ්‍යාව | 09 |
| පළාත් සභා නියෝජිත සංඛ්‍යාව | 04 |
| පළාත් පාලන ආයතන නියෝජිත සංඛ්‍යාව | 37 |
| ජනගහණය | 131462 |

## 4. ආයතන ව්‍යූහය සහ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

### 4.1 සංවිධාන සිතියම



## 4.2. අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ( වැයශීර්ෂ-1 )**

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | වත්මන් කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | ජ්‍යේෂ්ඨ මට්ටම (අ) | | | | | |
| 1 | දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | විශේෂ | 1 | 1 | 0 |
| 2 | අතිරේක දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | I | 1 | 1 | 0 |
| 3 | සහකාර දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | III | 1 | 1 | 0 |
| 4 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී. ලං. ග. සේ | I | 1 | 1 | 0 |
| 5 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී. ලං. ග. සේ | I | 1 | 0 | 0 |
| 6 | ගණකාධිකාරී | ශ්‍රී. ලං .ග . සේ | III | 1 | 1 | 0 |
| 7 | ඉංජිනේරු | ශ්‍රී. ලං. ඉ. සේ | III | 1 | 1 | 0 |
| | 3 වැනි මට්ටම (ආ) | | | | | |
| 8 | පරිපාලන නිළධාරී | අධි ශ්‍රේණිය | අධි ශ්‍රේණිය | 1 | 1 | 0 |
| 9 | භාෂා පරිවර්තක | පරිවර්තක සේවය | I | 1 | 0 | 1 |
| | 2 වැනි මට්ටම(ඇ) | | | | | |
| 10 | සංවර්ධන සම්බන්ධීකාරක | උපාධිධාරී | | 2 | 0 | 2 |
| 11 | අය වැය සහකාර | උපාධිධාරී | | 1 | 1 | 0 |
| 12 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක . ස. සේ | I,II,III | 34 | 33 | 1 |
| 13 | කාර්මික නිළධාරී | ශ්‍රී. ලං. තා. සේ | IIආ | 1 | 0 | 1 |
| 14 | ඩ්‍රාෆ්ට්මන් | ශ්‍රී. ලං. තා. සේ | IIආ | 1 | 0 | 1 |
| 15 | පිළිගැනීමේ නිළධාරී | | | 1 | 1 | 0 |
| | 1වැනි මට්ටම(ඈ) | | | | | |
| 16 | රියදුරු | රියදුරු සේවය | IIආ,IIඅ,I | 6 | 5 | 1 |
| 17 | කාර්යාල කාර්ය සහායක | කා. කා.සේ | I,II,III | 15 | 10 | 5 |
| 18 | මුරකරු | | | 2 | 2 | 0 |
| | එකතුව | | | 72 | 60 | 12 |

## ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ව්‍යාපෘති-2)

| අනු අංක -ය | තනතුර | සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | වත්මන් කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | ජ්‍යේෂ්ඨ මට්ටම (අ) | | | | | |
| 01 | ප්‍රාදේශීය ලේකම් | ශ්‍රී. ලං. ප. සේ | I | 4 | 4 වැඩබලන ශ්‍රීලංකා.ප.සේ III | 0 |
| 02 | සහකාර ප්‍රාදේශීය ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | III | 4 | 0 | 4 |
| 03 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | III | 4 | 4 | 0 |
| | 3 වැනි මට්ටම(ආ) | | | | | |
| 04 | පරිපාලන නිළධාරී | රා.ක .ස.සේ | අධි ශ්‍රේණිය | 4 | 3 වැඩබලන | 1 |
| 05 | පරිපාලන ග්‍රාම නිළධාරී | ග්‍රා.නි.සේ | අධි ශ්‍රේණිය | 4 | 0 | 4 |
| 06 | භාෂා පරිවර්තක | ප.සේ | | 4 | 0 | 4 |
| | 3වැනි මට්ටම(ඇ) | | | | | |
| 07 | අයවැය සහකාර | උපාධිධාරි | | 4 | 0 | 4 |
| 08 | සංවර්ධන සම්බන්ධීකාරක | උපාධිධාරි | | 4 | 0 | 4 |
| 09 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | I,II,III | 150 | 52 | 98 |
| 10 | ග්‍රාම නිළධාරී | ග්‍රා.නි.සේ. | I,II,III | 95 | 51 | 44 |
| 11 | කාර්මික නිළධාරී | ශ්‍රී.ලං.තා.සේ | | 4 | 0 | 4 |
| 12 | ඩ්‍රාෆ්ට්මන් | ශ්‍රී.ලං.තා.සේ | | 4 | 0 | 4 |
| | 1වැනි මට්ටම(ඇ) | | | | | |
| 13 | ලේඛණ භාරකරු | කා.කා. සේ | | 4 | 0 | 4 |
| 14 | රියදුරු | රියදුරු සේවය | IIඅ, IIආ, I | 12 | 9 | 3 |
| 15 | දුරකතන ක්‍රියාකරු | කා.කා. සේ | I | 4 | 0 | 4 |
| 16 | මුරකරු | කා.කා. සේ | II | 12 | 3 | 9 |
| 17 | කාර්යාල කාර්ය සහායක | කා.කා. සේ | III | 33 | 19 | 14 |
| 18 | සනීපාරක්ෂක කම්කරු | කා.කා. සේ | II | 4 | 2 | 2 |
| 19 | උද්‍යාන කම්කරු | කා.කා.සේ | II | 4 | 0 | 4 |
| 20 | පොත් බඳින්නා | කා.කා. සේ | I | 4 | 1 | 3 |
| | එකතුව | | | 362 | 148 | 214 |

# 05. කාර්ය සාධනය

## 5 .1. රාජ්‍ය පරිපාලන කටයුතු

**(අ)** මෙම දිස්ත්‍රික්කයේ පවතින විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල උපාධිධාරී අභ්‍යාසලාභීන් වශයෙන් **2012** වර්ෂයේ දී පත් වූ උපාධිධාරීන් **395** දෙනා **2013** ජුලි මස **02** වන දින සිට සංවර්ධන නිළධාරීන් ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ස්ථිර කර පත්වීම් ලිපි ලබා දී ඇත. පත්වීම් ලාභින්ගේ තොරතුරු පහත සඳහන් වේ

| | |
|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනෙකුත් දෙපාර්තමේන්තු | **127** |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කරච්චි | **87** |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කණ්ඩාවලයි | **55** |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පූනකරි | **65** |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පච්චිලෛපල්ලි | **61** |

**(ආ)** අලුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි සංකීර්ණයේ අදියර **01** ක් කෙයාර් ව්‍යාපෘතිය යටතේ ඉදි කරමින් පවතින අතර එය **2014** දී සම්පූර්ණ වීමේ තත්වයේ පවතී.

### (ඉ) අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කමිටුව මෙම වසරට අදාළ වාර්ෂික සැලසුම් සකස් කර ඒවාට සරිලන පරිදි තමන්ගේ කටයුතු ඉදිරියට ගෙනයන ලදී. මෙම වසරේ දී අභ්‍යන්තර විගණන වාර්තා **14**ක් සකස් කර ඒවායේ පිටපත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ද යොමු කර ඇත. එමෙන් ම මෙම වසරේ දී කළමණාකරණ විගණන කමිටු රැස්වීම් **03**ක් පවත්වා අභ්‍යන්තර විගණනය තුළින් හඳුනා ගත් කරුණු , රාජ්‍ය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සම්බන්ධ කරුණු හා ඒවාට විරුද්ධව ගත් ක්‍රියමාර්ග සම්බන්ධව සමාලෝචනය කරන ලදී.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට ක්ෂේත්‍ර සංචාරයේ යෙදෙමින් ගිණුම් අංශ පරිපාලන අංශ සැලසුම් අංශ සමාජ සේවා අංශය හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශය අධීක්ෂණය කරන ලදී. ගිණුම් අංශයේ ගෙවීම් වවුචර් සනාථ කරනලිපි ලේඛණ, රිසිට්පත්, චෙක්පත් තොග සම්බන්ධ ලිපි ලේඛණ, ණය සම්බන්ධ ලිපි ලේඛණ, වාහන සංචල ලේඛණ, පඩි සම්බන්ධ ලිපි ලේඛණ, සම්මත මුදල් ලේඛණ, පොදු තැන්පත් ලේඛණ වැනි ලිපි ලේඛණද ගිණුම් අංශයට අදාළ අනෙකුත් සියලු ලිපි ලේඛණ ද අධීක්ෂණයට භාජනය වේ .පරිපාලන අංශයේ දී එම අංශයට අදාළ සියලු ලිපි ලේඛණද විගණනය කරනු ලබයි. සැලසුම් අංශයේ දී වවුචර් ගෙවීම් සනාථ කිරීමේ ලිපි ලේඛණ රිසිට්පත් හා සැලසුම් අංශයේ වැඩසටහන්වලට අදාළ ලිපි ලේඛණ සහ එම අංශයට අදාළ සියලු ලිපි ලේඛණ ද විගණනය කරනු ලබයි සමාජ සේවා අංශයෙන් ලබා දෙන ආධාර කුමන පදනම මත හා කුමන පුද්ගලයින්ට ලබා දෙන්නේ එවැනි ආධාර සත්‍ය වශයෙන් පීඩාවට පත් වූවන්ට ලැබේ ද යන්න සොයා බැලීම සඳහා ප්‍රතිලාභීන්ගේ විස්තර සමග ගෙවීම් වවුචර් ද පරීක්ෂාවට ලක්වේ.

උප්පැන්න මරණ හා විවාහ ලියාපදිංචිය සම්බන්ධව භාවිතා කරන ලිපි ලේඛණ විගණනයට ලක්කර ඒවාට අදාළව මුදල් ලැබීම එදින ම බැංකුවේ තැන්පත් කරනවා ද යැයි විගණනය කර ඇත.

පෙරපාසල් ළමුන්ට ලබා දෙන කිරි සම්බන්ධ ලියකිලවිලි විගණනය කර එක් එක් පෙරපාසලටම ගොස් ළමුන්ට ලබා දෙන කිරි ප්‍රමාණය සනාථ කරනු ලබයි.

විගණන කළමණාකරණ දෙපාර්තමේන්තුවේ මගෙපන්වීමෙන් අභ්‍යන්තර විගණනකරුවන් විසින් සමෘද්ධි අධිකාරියේ 2013 වසරට අදාළ භාණ්ඩ සමීක්ෂණ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 4 යටතේ ක්‍රියාත්මක වන සමෘද්ධි ප්‍රධාන කාර්යාලය, සමෘද්ධි බැංකු ශාඛාවන්, මහා සංගමය වැනි ස්ථානවලදී විගණනය කර වාර්තා සපයන ලදී.

## (ඊ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**2013** වසරේ අප දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් අංශයේ ශාලාවෙන් මහජනතාවට ලබා දුන් සේවාවන් සහ කාර්යයන්

**01.** අප විසින් බාර ගනු ලැබූ රියදුරු බලපත්‍ර සඳහා ඉල්ලුම්පත්‍ර

| | |
|---|---|
| අලුත් අයදුම්පත් | **4140** |
| බර වාහන දිගුව | **130** |
| සැහැල්ලු වාහන දිගුව | **220** |
| මුලු අයදුම්පත් | **4490** |

**02.** අප විසින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණ සම්බන්ධ තොරතුරු

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි සංඛ්‍යාව | **4270** |
| ලිඛිත පරීක්ෂණයට දෙවැනි, තුන්වැනි, හතරවැනි වරට පෙනී සිටි අය | **2100** |

මෙලෙස ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි අයගෙන් **3915** ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ගෙන ඇත.

**03.** ප්‍රායෝගික විභාග විස්තර

**2013** වසරේ දී **3981** අයදුම්කරුවන් තාවකාලික රියදුරු බලපත්‍ර ලබාගන්නා ලදි. මෙම වසරේ සමත්වූවන් හා ඊට කලින් අවුරුදුවල සමත් වුවන් ඊට ඇතුළත් ව ඇත.

**04.** වාහන ලියාපදිංචි පොත් නිකුත් කිරීම හා වෙනත් කාර්යයන් සඳහා වාහන **236**ක් පරීක්ෂා කර වාහන පරීක්ෂණ සහතික නිකුත් කරන ලදි.

**05.** බර සහතික ලබා ගැනීම සඳහා බර සහතික **18**ක් නිකුත් කරන ලදි.

**06.** මෙම ශාඛාව තුළින් **2013** වසරේදී අංක තහඩු **553**ක් නිකුත් කරන ලදි.

## ( උ) පුහුණු පන්ති

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ අපගේ දිස්ත්‍රික්කයට අභ්‍යාසලාභීන් ලෙස පත්වීමේ ලැබූ උපාධිධාරීන් සඳහා ආරම්භක පුහුණුව ලබා දී ඇත. මාණ්ඩලික නිළධාරින් හා කළමණාකරණ සහකරුවන්ට මිලදී ගැනීම් ක්‍රියාවලිය සම්බන්ධ පුහුණුව ද කළමණාකරණ සහකරුවන්ට චෙක්පත්, බිල්පත්, පොත් හා සිගාස් සම්බන්ධ පුහුණුවද අප විසින් ලබා දී ඇත.

## (ඌ) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා

### 1.සමාජ ඒකාබද්ධතා හා අධ්‍යාපන

- සමාජ ඒකාබද්ධතා සතිය උදෙසා සමාජ ඒකාබද්ධතා අධ්‍යාපන යන තේමාව යටතේ පස්වෙනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව සිසුන් සඳහා විභාග පෙරහුරු වැඩමුලුව 2013 ජූලි මාසයේදී පච්චිලෙපල්ලි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අදාළ සිසුන් සඳහා පලෛ මධ්‍යම විදුහලේ කරච්චි, කණ්ඩාවලයි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අදාළ සිසුන් සඳහා කිලිනොච්චි මහා විද්‍යාලයේ ද, පූනකරි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ළමුන් සඳහා පූනකරි මහා විද්‍යාලයේ ද පවත්වන ලදි. දුප්පත් ළමුන් 501 දෙනෙක් මෙමගින් ප්‍රයෝජන ලැබූහ. මෙහිදී 500කට වැඩි ළමුන් සහදා ත්‍රෛ භාෂා පොත්, වැඩමුලු අත්පත්‍රිකා ගොණුව, පෑන වැනි ද්‍රව්‍ය ලබා දෙන ලදී.
- කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ආනෛවිලුදාන් ග්‍රාම නිලධාරී වසමේ කාසි පෙරපාසල අලුත්වැඩියා කටයුතු මහජනතාවගේ සහභාගිත්වයෙන් 2013 ජූලි මාසයේ ආරම්භ කර අගෝස්තු මාසයේ අවසන් කරන ලදි.

### 2. ළමා ප්‍රවර්ධන වැඩසටහන්

- ජුනි මාසයේ දී කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සිටින දෙමාපියන් අහිමි වූ හා මව හෝ පියා අහිමි වූ ළමුන් 150 දෙනෙකුට පාසල් බෑග් හා උපකරණ කට්ටල ලබා දෙන ලදි.

### 3. නිති උපෙදස් හා නීති ආධාර

- නීති උපෙදස් හා නීති ආධාර ලබා දීමේ ජංගම සේවාව 2013 ජූලි මස කරච්චි ප්‍රාදේශිය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී දී පවත්වන ලදි. මහජනතාවට ඔවුන්ගේ නීති අයිතිවාසිකම් සම්බන්ධව දැනුවත් කරන ලදි. මෙහිදී උරුත්තුතිරපුරම් උරුත්තුරපුරම් උතුර, උරුත්තුතිරපුරම් දකුණ, උරුත්තුරපුරම් නැගෙනහිර යන ග්‍රාම නිලධාරි වසමේ ජනතාවන් හා සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන් ඇතුලුව 153 දෙනෙක් සහභාගී වූහ. ඔවුන්ට ජාතික හැඳුනුම්පත්, උප්පැන්න සහතික, මරණ සහතික, විවාහ සහතික හා ඉඩම් ඔප්පු ලබාගැනීම සඳහා වන උපදෙස් ද විවාහ කරුනු වන නඩත්තු මුදල, දික්කසාද දේපල ලබාගැනිම සම්බන්ධ උපෙදස් ද නීති විරෝධි කටයුතුවලින් ඇතිවන ප්‍රතිඵල ගැන ද දැනුවත් කරන ලදි.

### 4. නීති ලේඛණ සම්බන්ධ විශ්ලේෂණ

- නීත්‍යානුලකූල ලියකියවිලි අවශ්‍යතාවය සම්බන්ධ සමීක්ෂණ කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අම්බාල් නගර් හා කොනාවිල් යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවල 2013-06-07

වන දා සිට **2013-06-16** වන දින දක්වා පැවැත් වූ අතර පවුල් **2028**කින් තොරතුරු ලබා ගන්නා ලදි.

- නීත්‍යානුලකූල ලියකියවිලි අවශ්‍යතාවය සම්බන්ධ සමීක්ෂණ කණ්ඩාවලෙ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කල්මඩු නගර් හා පුන්නෙයි නීරාවී යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල **2013-06-07** වන දා සිට **2013-06-14** වන දින දක්වා පැවැත් වූ අතර පවුල් **2393**කින් තොරතුරු ලබා ගන්නා ලදි.
- නීත්‍යානුලකූල ලියකියවිලි අවශ්‍යතාවය සම්බන්ධ සමීක්ෂණ පූනකරි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පල්ලිකුඩා හා නාච්චිකුඩා යන ග්‍රාමනිලධාරී කොට්ඨාශවල **2013-06-07** වන දා සිට **2013-06-13** වන දින දක්වා පැවැත් වූ අතර පවුල් **1689**කින් තොරතුරු ලබා ගන්නා ලදි .

## 5. ජංගම සේවාව

| දිනය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ග්‍රාම නිලධාරි කොට්ඨාශ | උප්පැන්න සහතික | මරණ සහතික | විවාහ සහතික | විවාහ ඉල්ලුම්පත් | විවාහ ලියාපදිංචි | කල් ගත වූ උපත් ලියාපදිංචි | කල් ගත වූ මරණ ලියාපදිංචි | සංශෝධන | වැඩිහිටි හැඳුනුම්පත් | ජාතික හැඳුනුම්පත් | සාම විනිසුරු වාර්තාව | පොලිස් වාර්තාව | නීති ආධාර උපදෙස් | ආයුර්වේද සායන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2013.11.18 | කරච්චි | මායවනූර් වට්ටකච්චි | 212 | 04 | 27 | | | 01 | | | 10 | 14 | 32 | 04 | | | 304 |
| 2013.11.19 | කරච්චි | අක්කරායන් ස්කන්දපුරම් | 291 | 11 | 48 | | | 02 | | 08 | 25 | 30 | 30 | 16 | 20 | | 481 |
| 2013.11.21 | කරච්චි | ආනෛවිලුන්දාන් වන්නේරිකුලම් | 384 | 21 | 62 | 05 | | | | 02 | 21 | 20 | 40 | 12 | 20 | | 587 |
| 2013.11.22 | පූනකරි | මුලන්ගාවිල් නාච්චිකුඩා | 373 | 19 | 66 | 15 | | | | | 11 | 04 | 23 | 08 | 25 | | 544 |
| 2013.11.23 | පූනකරි | ජෙයපුරම් උතුර පල්ලවරායන්කට්ටු උතුර | 249 | 10 | 43 | | | 12 | | 09 | 26 | 08 | 25 | | 35 | | 417 |
| 2013.11.25 | කණ්ඩාවෙලයි | ඌරියාන් කෝරක්කන්කට්ටු | 160 | 08 | 38 | | | 40 | | 05 | 04 | 16 | 10 | 16 | 16 | | 313 |
| 2013.11.26 | කණ්ඩාවෙලයි | පුන්නෙයිනීරාවි | 237 | 08 | 55 | | | | | | 06 | 28 | 26 | 08 | 28 | | 396 |
| 2013.11.28 | කණ්ඩාවෙලයි | ධර්මපුරම් නැගෙනහිර කල්මඩුනගර් | 375 | 28 | 80 | | | 58 | | | 10 | 30 | 40 | 31 | 15 | | 667 |
| 2013.11.29 | කණ්ඩාවෙලයි | කිරාන්චි | 415 | 16 | 46 | 08 | | 70 | | | 24 | 35 | 17 | 02 | 17 | | 650 |
| 2013.12.13 | පූනකරි | කොට්ඨාශ 19 | 417 | | | | | | | | 58 | 106 | 08 | 11 | 28 | 39 | 667 |
| 2013.12.14 | කරච්චි | ග්‍රාම  නිලධාරි වසම් 42 | 1278 | | | | 24 | 209 | | | 75 | 246 | 150 | 72 | 50 | 61 | 2165 |
| 2013.12.15 | කණ්ඩාවෙලයි | ග්‍රාම නිලධාරි වසම් 16 | 320 | | | | 27 | 23 | | | 14 | 164 | 156 | 21 | 28 | 63 | 816 |

**6.** ජනතා සහභාගීත්ව ශ්‍රමදාන කටයුතු

- භාෂා සංගම් සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් ඉටු කරන ලදි ක්‍රිෂ්ණපුරම් රාම ක්‍රිෂ්ණා විදුහලේ දී ක්‍රිෂ්ණපුරම් හා විනායහ පුරම් භාෂා සංගම් සාමාජිකයන් පාසල් සිසුන් ගුරුවරුන් ඇතුළු හැත්තෑ දෙදෙනෙක් එයට සහභාගි වූහ. මෙමගින් පාසැල් ගොඩනැගිල්ලේ කොටසක් පොල් අතු යොදා ආවරණය කිරීම ළිං සුද්ද කිරීම හා වැට පිලිසකර කිරීම ආදී කටයුතු කරනු ලැබූහ.

- පුදුමරිප්පු භාෂා සංගම් සාමාජිකයින් ග්‍රාම නිලධාරින් ඇතුලු පනස් දෙනෙක් සහභාගි වී බහුකාර්ය ශාලාව සමෘද්ධි ශාලාව හා ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ යළි පිබිදෙමු ගොඩනැගිල්ල අවට ප්‍රදේශය සුද්ද පවිත්‍ර කරන ලදී.

- ස්කන්ධපුරමේ ක්‍රීඩා පිටිටනිය පාසල් සිසුන්, ගුරුවරුන්, භාෂා සංගම් සාමාජිකයින්, ක්‍රීඩා සමාජ සාමාජිකයින්, සමෘද්ධි ප්‍රතිලාභින් ඇතුලු **250** දෙනෙක්ගේ සහභාගිත්වෙයන් පදුරු ඉවත් කර සුද්ද කරන ලදී.

**7.** ජාතීන් අතර සහෝදරත්වය ගොඩනැංවීම

- ශ්‍රී ලංකා දේශය තුළදී ජාතිය, සහෝදරත්වය ගොඩනගමු යන තේමා පාඨය යටතේ ගොවි අයිතිවාසිකම් රැක ගැනීමේ ජාතික සංවිධානය නිරීක්ෂණ හා අධ්‍යයන සංචාරය ඔස්සේ උමයාල්පුරම් රජයේ දෙමළ මිශ්‍ර පාසලේ සිසුන්ට ඉගැන්වීමේ උපකරණ ලබා දෙන ලදී.

- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධ අමාත්‍ය ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සමාජ ඒකාබද්ධතා පිළිබඳ සාකච්ඡාව කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී **2013** පෙබරවාරි මාසයේදී පවත්වන ලදී.

**8.** භාෂා සම්බන්ධ වැඩසටහන්

- ජාතික භාෂා සංගම්

  ජනතා සංවිධාන වැඩසටහන් යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේදී ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ **4** කදී භාෂා සංගම් **62**ක් ලියා පදිංචි කරන ලදී. ඒ හරහා මහජනතාවට භාෂා පන්ති පවත්වනු ලැබෙයි.

- දෙවන භාෂාව රාජ්‍ය සේවයේ දියුණු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ අගෝස්තු මාසයේදී ද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මට්ටම් **111** හා මට්ටම් **11** පංති පවත්වන ලදි.

- 2013 සැප්තැම්බර් මාසයේ දී කරච්චි හා පච්චිලෛයිපල්ලි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට මට්ටම් 111 සිංහල පංති පවත්වන ලදි.

- 2013 නොවැම්බර් මාසයේ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය සමග උතුරු පළාත් සභාවේ කළමණාකරණ පුහුණු ලේකම් කාර්යාලයද එක්ව දවස් 12 කින් සමන්විත සිංහල භාෂා පාඨමාලා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සේවකයන් හා අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු සේවකයින් ඇතුලු 108 දෙනෙකුට ප්‍රාදේශිය සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේදී 2013 නොවැම්බර් 18 සිට 2013 නොවැම්බර් 29 වනදා තෙක් පවත්වන ලදී.

- අප්‍රෙල් මාසයේ රාජ්‍ය භාෂා ප්‍රත්පත්තිය ක්‍රියාවට නැංවීම සඳහා වන වගකීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලු අංශ භාර නිලධාරින්ට පවරන ලදී.

- මාර්තු මාසයේ දී මග දැක්ම මූලික දත්ත ඒක්රැස් කළ අතර මෙය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජ්‍ය භාෂා ක්‍රියාත්මක මග දැක්ම ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධ අමාත්‍යාංශ විසින් සංවිධානය කරන ලදි.

- 2013 මාර්තු මාසෙය් දී නිලධාරීන්ගේ නිල රථවල තනතුරු, නාමපුවරු, ත්‍රෛභාෂා සකස් කිරීමේ අවශ්‍යතාව පිළිබද සියලු ප්‍රාදේශිය ලේකම්වරුන්ට හා අනෙකුත් රජයේ දෙපාර්තමේනතුවලටද දැනුම් දෙන ලදී.

- පච්චිලෛපල්ලි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ රාජය භාෂා සංගමයේ භාෂා අධ්‍යාපන පාඨමාලා 2013 අගෝස්තු මාසයේ දී ආරම්භ කරන ලදි. මෙය සිංහල භාෂා පුහුණු පාඨමාලා තුළින් සිසුන් 50ක් ප්‍රයෝජන ගත්හ.

- සිංහල භාෂාව පමණක් භාවිතා කරන රජයේ වැඩසටහන් හා ව්‍යාපෘති හදුනා ගැනීමේදී දෙමළ හා ඉංග්‍රීසි භාෂා භාවිතා කිරීමේ අත්‍යවශ්‍ය පිළිබද සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට 2013 ජුලි මාසයේදී දැනුම් දෙන ලදී.

9. පළාත් භාෂා පුහුණු මධ්‍යස්ථානය ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය පළාත් භාෂා පුහුණු මධ්‍යස්ථානයේ නාම පුවරුව තොන්ඩමන් නහර්කි ස්ථාපිත කරන අතර අප්‍රේල් මාසයේදී එම ඉඩෙම් මිනින්දෝරු කටයුතු සිදු කරන ලදී. අගෝස්තු මාසයේ දී මධ්‍යස්ථාන පරිශ්‍රය පිරිසිදු කිරීමේ කටයුතු කරන අතර එම ඉඩම් බලපත්‍ර ලබා ගැනීමේ කටයුතු සිදු කර ඉඩමේ ඔප්පුව අමාත්‍යංශයට බාර දෙන ලදී.

## (ඒ) මැතිවරණ දෙපාර්තමේන්තුව

2013 වසර සඳහා ඡන්දහිමි නාම ලේඛණ සංශෝධනය 2013 ජුනි 01 වන දින සිට ආරම්භ කරන ලදී. සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරින් සඳහා සමාලෝචන රැස්වීම් පවත්වා අදාල ආකෘති පත්‍ර බෙදා දෙන ලදි. ඔක්තෝබර් මස අවසානයට පෙර සියලු දෙනාගේම ලියාපදිංචියන් ග්‍රාම නිලධාරීන් හරහා තහවුරු කරන ලෙස දැනුම් දෙන ලදී.

ඒ සඳහා සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයකදීම මහජනතා ප්‍රදර්ශනය සඳහා 2012 වසර සඳහා ලේඛනය ජුනි 01 වන දින සිට තබන ලදී.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අගෝස්තු මස ඒ ඒ ග්‍රාම නිලධාරීවරුන් විසින් සෘජුවම මැතිවරණ කාර්යාලවලට ගොස් නිවරැදිතාවය පරීක්ෂා කර භාර දෙන ලදී.

මෙම නැවත පරික්ෂාවේදී ලැබුණු තොරතුරු මගින් කිළිනොච්චිය දිස්ත්‍රික් ලේඛණවලින් 2013 වසරට අදාළ පරිගණක ගත කරන ලද 'ඒ' සටහන් සහ "බී" සටහන්වලද ලේඛණය සකස් කර මෙම ලේඛණය 2013.10.02 දින සිට 2013.10.30 දින දක්වා මහජන ප්‍රදර්ශනය සඳහා පියවර ගෙන ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ ලැබෙන විරෝධතා, හිමිකම් ඉල්ලීම්, සංශෝධන සමඟ 2013 වසර ඡන්දහිමි නාම ලේඛණ කටයුතු සියල්ල 2013 දෙසැම්බර් මාසයේ දී අවසන් කරන ලදී.

2013 වසර සඳහා නාම ලේඛණ 2013.12.31 සහතික කරන ලදී. 2013 වසර අනුව මුළු ඡන්දහිමි සංඛ්‍යාව 75,465 ක් වේ.

ග්‍රාම නිලධාරින් සඳහා දීමනා සියල්ල යාපනය මැතිවරණ කාර්යාලය විසින් කරන ලදි.

කිළිනොච්චි මැතිවරණ කාර්යාලය මගින් උද්ධෘත 3607 ක් 2013 වසරේදි ලබා දෙන ලදී.

මීට අමතරව උතුරු පළාත් සභා ඡන්ද විමසීම් 2013 සම්බන්ධ කටයුතු කිලිනොච්චි මැතිවරණ කාර්යාලයෙන් දියත් කරන ලදී. මෙම මැතිවරණයේදී 2013 ජූලි මස 25 වන දා සිට 2013 අගෝස්තු මස 01 දින දක්වා නාම යෝජනා භාර දීමේ කාලය ලෙස ප්‍රකාශ කරන ලදී. මෙම කාලයේදී පක්ෂ 11 ස්වාධීන කණ්ඩායම් 03 භාරදුන් අතර එයින් පක්ෂ 11 ස්වාධින කණ්ඩායම් 02 නාම යෝජනා පිළි ගන්නා ලදී .

මෙම මැතිවරණය සඳහා තැපැල් ඡන්ද සලකුණු කිරීමට අයදුම්පත් 970ක් භාර ගත් අතර 2013 සැප්තැම්බර් 09 හා 10 යන දිනයන්හි තැපැල් ඡන්ද කටයුතු සිදු කරන ලදී. 2013 සැප්තැම්බර් 21 වන දින උතුරු පළාත් සභා ඡන්ද විමසීම පවත්වන ලදී. මෙම මැතිවරණයට ඡන්ද දායකයින් 68600 ක් සුදුසුකම් ලබන ලදී.

**2013 වසරේ ඡන්දහිමි තොරතුරු**

| | |
|---|---|
| **කරෙච්චි** | **38,333** |
| **කණ්ඩාවලෙ** | **15,162** |
| **පූනකරි** | **13,268** |
| **පච්චිලෙප්පල්ලි** | **8,702** |
| **ඒකතුව** | **75,465** |

**(එ) ජාතික හැඳුනුම්පත් ලබා දීම සම්බන්ධ කටයුතු**

- **කරෙච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 4130 ක් වේ. ඉන් ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව 2639ක් වේ.**
- **කණ්ඩාවලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 1432 ක් වේ. ඉන් ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව 887 ක් වේ.**
- **පච්චිලෙපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 508 ක් වේ. ඉන් ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව 268 ක් වේ.**
- **පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 1248 ක් වේ. ඉන් ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව 1093 ක් වේ.**

(ඒ) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

| අංකය | විස්තරය | සංඛ්‍යාව | මුද්දර වටිනාකම |
|---|---|---|---|
| 1 | වසරේ ලියාපදිංචි කරන ලද ඔප්පු | 1,780 | 175700.00 |
| | වසරේ ලියාපදිංචි කරන ලද ප්‍රධානපත් | 231 | |
| 2 | වසරේ ලැබුනු ඔප්පු පිටපත් | 847 | |
| 3 | පිටපත් ලබා ගැනීම සඳහා ලැබුණු පිටපත් | | |
| | අ.ඉඩම් ලියාපදිංචි සහතික | 253 | 31100.00 |
| | ආ. ඔප්පු පිටපත් | 44 | 20400.00 |
| 4 | සෙවීමේ අයදුම්පත් - ඉඩම් ලේඛණ | 03 | 1500.00 |
| 5 | පිටපත් සඳහා අලවන ලද මුද්දර ගාස්තු | | 3816266·50 |
| 6 | ලියාපදිංචි කරන ලද විවාහ | 1010 | |
| 7 | ලියාපදිංචි කරන ලද උපත් | 3063 | |
| 8 | ලියාපදිංචි කරන ලද මරණ | 401 | |
| 9 | අනුමත කරන ලද සංශෝධිත සහතික | 984 | |
| 10 | නිකුත් කරන ලද අනුමාන වයස සහතික | 56 | |
| 11 | ලියාපදිංචි කරන ලද කල් ගත වු උපත් | 767 | |
| 12 | ලියාපදිංචි කරන ලද කල් ගත වු මරණ | 36 | |
| 13 | විවාහ,උපත්,මරණ සහතික හා අනුමාන වයස සහතික පිටපත් ලබා ගැනිම සඳහා ලැබු අයදුම්පත් | අ - 26124<br>ආ - 7167 | 3340700.00<br>1431900.00 |
| 14 | ලබා දුන් පිටපත් | අ -26862<br>ආ - 3699 | |

* කරච්චි , පලෙෙ , කණ්ඩාවෙලෙ යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලදී උපැන්න මරණ සහ විවාහ සහතික පරිගණක ගත කර නිකුත් කරනු ලබයි.

## (ඔ) දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛණ කටයුතු

රටේ සමාජ ආර්ථික වාතාවරණ සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීම, විධිමත් කිරීම, විශ්ලේෂණ කිරීම, ප්‍රකාශ කිරීම හා සංඛ්‍යාලේඛණ නිර්නායකයන් නිර්ණය කිරීම වැනි වගකීම් මධ්‍යම රජයේ නියෝජිත ආයතනයක් වන සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවට අයත් වෙයි.

සංඛ්‍යාලේඛණ ශාඛාව මගින් ආර්ථික සංගණන කටයුතුවන වතුයායවල් ලැයිස්තු ගත කිරීම, කර්මාන්ත වාණිජ හා සේවා ආයතන ලැයිස්තු ගත කිරීම, අභ්‍යන්තර යුද්ධයෙන් මරණයට පත් වූවන් අතුරුදහන් වූවන් හා තුවාල ලැබූවන් සහ දේපල හානිය සම්බන්ධ සංගණන, වසරේ සාමාන්‍ය වී අස්වැන්න ගණනය කිරීම සඳහා වසරට දෙවරක් පවත්වන ආදර්ශ ගණනය කිරීම්, ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණ වාර්ෂික කර්මාන්ත ඉදි කිරීම් සමීක්ෂණ, වී සංඛ්‍යා ලේඛණ තොරතුරු රැස් කිරීම, ගොඩබිම් බෝග වගා තොරතුරු, පශු සම්පත් සංඛ්‍යා ලේඛණ තොරතුරු, ගොඩනැගිලි සංඛ්‍යා ලේඛණ තොරතුරු සහ සිල්ලර මිල සහ නිෂ්පාදන වල නිෂ්පාදකයින්ගේ මිලද සංඛ්‍යා ලේඛණ ශාඛාව විසින් 2013 වර්ෂයේදී සිදු කරන ලදී.

## (ඕ) ආපදා කළමනාකරණ කටයුතු

**ගංවතුර හේතුවෙන් ජනවාරි සහ පෙබරවාරි මාසවලදී කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පවුල් 563ට අයත් සාමාජිකයන් 2145ද කණ්ඩාවෙලයි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පවුල් 3930 ට අයත් සාමාජිකයන් 14782 ද පූනකරි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පවුල් 321 ට අයත් පීඩාවට පත්වූහ. එහිදී ආරක්ෂක ස්ථාන 11දී පවුල් 663ට අයත් සාමාජිකයන් 2302 නවාතැන් ලබා දී ඔවුන්ට පිසූ ආහාර ලබා දෙන ලදී. පීඩාවට පත් වූ ජනතාව සදහා වන සහනාධාර ආපදා කළමණාකරන අමාත්‍යංශ හා රාජ්‍ය නොවන සංවිධාන විසින් ලබා දෙන ලදී. ගංවතුර ආපදාවලින් පිඩාවට පත් වූ ජනතාවට පිසූ ආහාර ලබා දීමටත් සහනාධාර ලබා දීමටත් 1000000/- ආපදා කළමනාකරණ අමාත්‍යංශයෙන් ලබා දී ඇත.**

**ආපදා වැළැක්වීමේ වැඩසටහන්**

**දිස්ත්‍රික් ආපදා කළමණාකරණ ඒකකයෙන් කන්ඩාවලෙයි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි පුන්නෙයිනීරාවි ග්‍රාම නිළධාරි වසමේ රුපියල් මිලියන 3.78 වියදමේ කර ඇළවල් සුද්ධ කරන ලදී.**




සුද්ධ කරන ලද ඇළවල්



**සුනාමි හා ගංවතුර ආපදාවන්ට අදාළ පෙරහුරුව**

**සුනාමි හා ගංවතුර වැනි ආපදා වෙනුවෙන් පෙරහුරු වැඩසටහන පූනකරි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා තිබෙන පොන්නහර්, පල්ලිකුඩා, නාච්චිකුඩා වැනි ග්‍රාමනිළධාරි වසම්වලද පලෙ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අල්ලිපලෙ, කිලාලි කොවිල් වයල් පුලොප්පලෙ වැනි ග්‍රාම නිළධාරි වසම්වලද කණ්ඩාවලෙයි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිරමන්දනාරු කට්ටුවන්කොට්ටි වැනි ග්‍රාම නිළධාරි වසම්වල ද සිදු කරන ලදී ගං වතුර ආපදා සදහා වූ පෙරහුරු වැඩ සටහන කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පන්නංකණ්ඩි සහ සිවික්සෙන්ටර් යන ග්‍රාමනිළධාරි වසම් වලද පැවැත්වුණි.**



ගං වතුර පෙරහුරු වැඩ සටහන පන්නංකණ්ඩි





සුනාමි පෙරහුරු වැඩ සටහන වලෙයිප්පාඩු



## ආපදාවලට සූදානම් කිරීමේ වැඩසටහන.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ ප්‍රථමාධාර පුහුණු පාඨමාලා ආපදා දැනුවත් කිරීමේ වැඩමුලු හා ප්‍රාදේශීය ආපදා කළමණාකරණ සැලැස්මද සකස් කර ඇත.

වර්ල්ඩ් විෂන් ඔක්ස්ෆාම් වැනි ආයතනයන්ගේ අනුග්‍රාහකත්වයෙන් දිස්ත්‍රික් ආපදා කළමණාකරණ ඒකක විසින් කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ග්‍රාම නිළධාරි වසම් 07 ආපදා කළමණාකරණ කමිටු සාමාජිකයන්ට ප්‍රථමාධාර දැනුවත් කිරීම් ආපදා තත්වය විශ්ලේෂණ සන්නිවේදන වැනි කරුණු සම්බන්ධ පුහුණු ලබා දෙන ලදී.



ප්‍රථමාධාර පුහුණු



ග්‍රාමීය මට්ටමෙ සිතියම් සකස්කිරීම



ගම්වැසියන් සමග සාකච්චා කිරිම



දැනවත් කිරීම් වැඩමළුව

**දිස්ත්‍රික් ආපදා කළමණාකරණ කමිටු සාමාජිකයන් සදහා දවස් තුනක පුහුණු පාඨමාලා හබරණ හෝටලයේදී පවත්වන ලදී.**





**ජාත්‍යන්තර ආපදා අවම කිරීමේ උත්සවය ඔක්තොම්බර් මස 13 වන දා දිස්ත්‍රික් ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම උත්සවයේදී ආපදා අවම කිරීම සම්බන්ධ වේදිකා නාට්‍ය වර්ල්ඩ් විෂන් ආයතනයේ අනුග්‍රාහකත්වයෙන් වේදිකා ගත කරන ලදී. නියං සමයේදී පානීය ජලය සැපයීම සදහා වර්ල්ඩ් විෂන් ආයතනයෙන් ආපදා කළමණාකරණ ඒකකයට ලබා දුන් බවුසර් රථය දිස්ත්‍රික් ලේකම් තුමිය විසින් කරච්චි ප්‍රාදේශිය සභාවට ලබා දෙන ලදී.**



ජාත්‍යන්තර
ආපදා අවම
කිරීමේ දිනය
2013



## ජාතික ආපදා ආරක්ෂක දින වැඩසටහන

**ජාතික ආපදා ආරක්ෂක දිනය 2013 දෙසැම්බර් 26 වනදා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී දිස්ත්‍රික් ලේකම් තුමියගේ ප්‍රධානත්වයෙන් සැමරූ අතර එහි දී 2012 වසරේ ගංවතුර ආපදාවලින් පීඩාවන්ට පත්වූ පච්චිලෛපලෛ, පූනකරි, කරච්චි, කණ්ඩාවලෛ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවලට අයත් මහජනතාවට ආපදා කළමනාකරණ අමාත්‍යංශයෙන් ලබා දෙන ලද ප්‍රතිපාදන පාර්ලිමේන්තු මන්ත්‍රී හා කිලිනොච්චි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපති වන ගරු එම් චන්ද්‍රකුමාර් මැතිතුමා විසින් චෙක්පත් ලබා දෙන ලදී.**



ජාතික ආපදා
ආරක්ෂක දිනය 2013



## ආපදා සහනාධාර සේවාවන්

**2012** වසරේදී ගංවතුර ආපදාවෙන් හානි වූ නිවාස සඳහා ගෙවීම් පහත සදහන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවලට ලබා දෙන ලදී.

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | හානි වූ නිවාස සංඛ්‍යාව | ගෙවීම් |
|---|---|---|
| පච්චිලෙපල්ලි | 12 | 495000.00 |
| පූනකරි | 20 | 941000.00 |
| කණ්ඩාවලෛ | 573 | 20369000.00 |
| කරච්චි | 147 | 8067000.00 |

**2013** වසරේදී නියං කාලයට පානීය ජලය සැපයීම සඳහා ආපදා කළමණාකරණ අමාත්‍යංශයේ ප්‍රතිපාදන ලබා දී පහත සදහන් කොට්ඨාසවලට චෙක්පත් ලබා දෙන ලදි.

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ | හානි වූ නිවාස සංඛ්‍යාව | ගෙවීම් |
|---|---|---|
| පච්චිලෙපල්ලි | 774 | 252250.00 |
| කණ්ඩාවලෛ | 2552 | 124737.00 |
| කරච්චි | 948 | 435000.00 |

කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කන්නගපුරම් ග්‍රාම නිළධරි වසමේ ගංවතුරෙන් මිය ගිය සින්ධුජන් යන අයගේ පවුලට ආපදා කළමණාකරණ අමාත්‍යංශයෙන් රුපියල් **15000/-**ක චෙක්පත් ලබා දෙන ලදී.

## 5.2 සමාජ සහ සංස්කෘතික කටයුතු

### (අ) දිස්ත්‍රික් උපදේශන අංශය

පාසල් මට්ටමේ සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පහත සඳහන් විෂය ආවරණය කර පවත්වන ලදී.

- ළමා ලිංගික අපයෝජන වැලැක්වීම
- ගැටවරවියේ ගැබ් ගැනීම් හා අඩුවයස් විවාහ
- ගැටවරවියේ ඇතිවන ගැටළු හා ඒවා හසුරුවා ගැනීම

  මෙලෙසම ග්‍රාම මට්ටමේ දී ද මානසින සමාජ ගැටළු අවම කිරීමෙ අරමුණ ඇතිව පහත සඳහන් විෂය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩ සටහන් සිදු කරන ලදී.

- මානසික සමාජ ගැටළු සහ ඒවා වැලැක්වීම
- ළමුන්ට ඇතිවන ප්‍රචණ්ඩත්වය සහ දෙමාපියන් සම්බන්ධ හැකියාවන්
- මත්පැන් භාවිතය
- අවිහිංසා සන්නිවේදන
- දෙමාපියන් සම්බන්ධ හැකියාවන් සහ නිවාස ප්‍රචණ්ඩත්වය
- පවුල් සීමාවන්

මේ අයුරින් උපදේශන ආශ්‍රිත විවිධ වැඩමුළු පවත්වන ලදී. මේවා ගුරුවරුන්, ග්‍රාමීය මට්ටමේ ආයතන, කාන්තා සංවිධාන, ළමා නිවාස සේවකයන්, සමාජ සහය සේවකයන්, විශේෂ අවශ්‍යතා ඇති අය, තරුණ පවුල් ආදිය ඉලක්ක කරගෙන පවත්වන ලදී. එම වැඩමුළු වලට පහත කරුණු ඇතුලත් විය.

- ළමුන් සහ ඔවුන්ගේ මානසික සමාජ ගැටළු
- විවාහයට පෙර උපදේශන
- ළමුන්ව අවබෝධ කර වැඩකිරීම
- මානසික ව්‍යසනය හා ඒවා හසුරුවා ගැනීම
- ළමා මානසික සෞඛ්‍ය
- වැඩිහිටි මානසික සෞඛ්‍ය අවබෝධ කර ගැනීම
- විශේෂ අවශ්‍යතාවන් සහිත පුද්ගලයින් සහ මානසික සෞඛ්‍ය

### (ආ ) ජාතික ළමා රක්ෂණ අධිකාරිය

මෙම අධිකාරිය මගින් ළමුන්, දෙමාපියන්, ගැබිණි මව්වරුන්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සේවකයන් (ගොවිපලේ සේවය කරන) වැනි අයට ළමා ආරක්ෂණ සම්බන්ධ වැඩමුළු පවත්වනු ලබයි. පාසල් ළමුන්ට හා ගුරුවරුන්ට ළමා අයිතිවාසිකම් රැක ගැනීම හා වගකීම් තේරුම් ගැනීම සම්බන්ධ දැනුවත් කිරීම් වැඩමුලුද පවත්වනු ලබයි. තවද පීඩාවට පත් වූ අධ්‍යයන පහසුකම් නැති සිසුන්ව හඳුනාගෙන ස්වේච්ඡා සංවිධාන සමග ඔවුන්ව සම්බන්ධ කර පාසැල් උපකරණ හා ජීවනාධාර සහය ලබා දීමට පියවර ගනු ලබයි. ළමා නිවාසවල සිට නැවත දෙමාපියන් හා භාරකරුවන් වෙත සම්බන්ධවීමට කමැත්ත පළ කරන ළමුන් නැවත සම්බන්ධ කරනු ලබයි.

තවද මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන ළමා නිවාසවලට ගොස් නිරීක්ෂණය කර ඒවායේ ප්‍රමිතීන් තක්සේරු කර ළමා නිවෙස් අවශ්‍යතාව සහ ප්‍රමිතිය තහවුරු කරනු ලබයි. තවද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වෙයන් පීඩාවට පත්වන කාන්තාවන් ආරක්ෂා කිරිමට ආරක්ෂක නිවසක් කනකපුරම්හි පිහිටුවීමට අවශ්‍ය පියවර ළමා හා කාන්තා කටයුතු සංවිධාන සමග එක්ව කඩිනමින් ඉදිරයට ගෙන යනු ලබයි.

## 2013 වසරේ දී ඉටු කළ වැඩසටහන් සම්බන්ධ විස්තර පහත සඳහන් වේ

| වැඩසටහන් | සංඛ්‍යාව | සහභාගි වූවන්ගේ සංඛ්‍යාව |
|---|---|---|
| දැනුවත් කිරීම් වැඩමුළුව | 33 | 2027 |
| ළමා නිවාස අධීක්ෂණය | 18 | 353 |
| සිසුන් සඳහා පාපැදි, පාසල් උපකරණ කට්ටල | 04 | 420 |
| වැඩමුළුව (ගුරුවරුන් ගම් මට්ටමේ සංවිධාන හා රාජ්‍ය නිලධාරින්) | 25 | 769 |
| පාසල් හා නිවාස නිරීක්ෂණ | 68 | 122 |
| සාකච්ඡාව (රජයේ හා රාජ්‍ය නොවන සංවිධාන) | 38 | 426 |
| 1929 සම්බන්ධ පැමිණිලි | 16 | 26 |
| ළමා සමාජ හා ජාත්‍යන්තර ළමා දිනය | 12 | 1756 |
| ළමුන් සම්බන්ධ අත් පතිකා බෙදා හැරීම | 30 | 15,000 |
| ගැබිනි මව්වරුන් සඳහා හදිසි සහනාධාර ලබා දීම | 30 | - |
| පාසල් හැර ගිය ළමුන් නැවත යැවීම | 05 | 76 |

## (ඉ) පුනරුත්ථාපන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

### 1. මහජනයාගේ දේපල වන්දි

මහජනයාගේ දේපළ වන්දි ලබා ගැනීම සඳහා පුනරුත්ථාපන අධිකාරිය වෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් යවන ලද විස්තර පහත සඳහන් වේ.

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව |
|---|---|
| කරච්චි | 4144 |
| කණ්ඩාවලෙයි | 1562 |
| පලෙෙ | 09 |
| පූනකරි | 1312 |
| එකතුව | 7027 |

**2.** පුනරුත්ථාපන අධිකාරිය විසින් පුනරුත්ථාපනය කරන ලද අය සඳහා ස්වයං රැකියා ණය ක්‍රමය.

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව |
|---|---|
| කරච්චි | **122** |
| කණ්ඩාවලෛ | **36** |
| පූනහරි | **52** |
| පච්චිලෛප්පල්ලි | **44** |
| එකතුව | **254** |

මෙම ප්‍රතිලාභීන් **254** දෙනා අතරින් **127** දෙනෙක් පමණක් සහභාගි වූ අතර ඔවුන් සඳහා වන ණය ලංකා බැංකුව හරහා ක්‍රියාත්මක වෙමින් පවතී

**3.**වැන්දඹුවන් සඳහා ස්වයං රැකියා ණය ක්‍රමය

මෙම ණය ක්‍රමය යටතේ දැනටමත් අයදුම්පත් යැවූ ප්‍රතිලාභීන් තෝරා ගන්නා ලදී විස්තර පහත සඳහන් වේ

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව |
|---|---|
| කරච්චි | **124** |
| කණ්ඩාවලෛ | **20** |
| පූනහරි | **17** |
| පච්චිලෛප්පල්ලි | **12** |
| එකතුව | **173** |

මෙම ප්‍රාතිලාභීන් **120** දෙනෙක් සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අතර ඔවුන් සඳහා වන ණය ලංකා බැංකුව හරහා ක්‍රියාත්මක වෙමින් පවතී

**4.** නිවාස හානිය ප්‍රතිසංස්කරණය සඳහා වන ණය ක්‍රමය **(250,000)**
මෙයින් කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් **25** දෙනෙක් තෝරා ගෙන ඇත

**5.** **පුනරුත්ථානය වූවන් සඳහා වන ස්වයං රැකියා ණය ක්‍රමය.**
**මෙම ණය ක්‍රමය පුනරුත්ථාපනය ලබා සමාජ ගත කර සිටින්නන් සඳහා ක්‍රියාත්මක වේ. මේ සඳහා යවන ලද ඉල්ලුම් පත් ප්‍රමාණය පහත සඳහන් වේ.**

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව |
| --- | --- |
| කරච්චි | **85** |
| කණ්ඩාවලෛ | **29** |
| පූනහරි | **13** |
| පච්චිලෛප්පල්ලි | **15** |
| එකතුව | **142** |

**6.** **යුද්ධයෙන් හානි වූ දේවස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.**
**යුද්ධයෙන් හානි වූ දේවස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 100,000 බැගින් දේවස්ථාන 06 කට ලබා දෙන ලදී ඒවායේ විස්තර පහත සඳහන් වේ.**

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව |
| --- | --- |
| කරච්චි | **01** |
| කණ්ඩාවලෛ | **03** |
| පච්චිලෛප්පල්ලි | **02** |

**7.** **යුද්ධයෙන් මිය ගිය හා තුවාල ලැබූවන්ගේ වන්දි ලබා දීම.**
**යුද්ධයෙන් මිය ගිය සාමාන්‍ය මහජනයාට 100,000 ක් ද රජයේ සේවකයන්ට 150,000 ද වන්දි වශයෙන් ලබා දෙයි තුවාල ලැබූවන් ගෙන් සාමාන්‍ය මහජනයාට 50,000 ක් ද රජයේ සේවකයන්ට 100,000 ද වන්දි වශයෙන් ලබා දෙයි. ඒ අනුව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දී 2013 වසරේ ගෙවීම් සම්බන්ධ විස්තර පහත සඳහන් වේ.**

| ප්‍රා.ලේ. කොට්ඨාශය | මිය ගිය සංඛ්‍යාව | තුවාල ලැබූ සංඛ්‍යාව |
| --- | --- | --- |
| කරච්චි | **85** | **21** |
| කණ්ඩාවලෛ | **52** | **16** |
| පූනහරි | **09** | **04** |
| පච්චිලෛප්පල්ලි | **25** | **01** |
| එකතුව | **171** | **42** |

**8.** රජයේ සේවකයන් සඳහා දේපළ වන්දි

රජයේ සේවකයන් සඳහා දේපළ වන්දි වශයෙන් 150,000ක් ලබා දෙයි ප්‍රදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම ප්‍රතිලාභ ගෙවීම් කරන ලදී

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව |
|---|---|
| කරච්චි | 20 |
| පූනහරි | 03 |
| පච්චිලෛප්පල්ලි | 06 |
| එකතුව | 29 |

පොදු ජනතාවගේ දේපළ වන්දි වශයෙන් රු. 100000ක් බැගින් ප්‍රතිලාභීන් 4 දෙනෙකුට අතිගරු ජනාධිපති තුමා විසින් අරලියගහ මන්දිරයේ දී චෙක් පත් ලබා දෙන ලදි.

## (ඊ) ක්‍රීඩා ක්ෂේත්‍රය

වර්ල්ඩ් විශන් ආයතනයේ අනුග්‍රාහකත්වයෙන් 2012 වසරේ දී දක්ෂකම් දැක් වූ ප්‍රාදේශීය ක්‍රීඩා සමාජ වලට 25,000 බැගින් ක්‍රීඩා උපකරණ කට්ටල 2013 වසරේ දී ලබා දෙන ලදී. මාර්තු මාසයේ දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ක්‍රීඩා සමාජ අතර ක්‍රීඩා තරග ආරම්භ කර අඛණ්ඩව සිදු කරන ලදී. මාර්තු මාසයේ දී ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය විසින් පවත්වන කණිෂ්ට මලල ක්‍රීඩා තරගයට කිලිනොච්චියෙන් තෝරා ගන්නා ලද තරගකරුවන් 06 දෙනෙක් සහභාගි වූහ. තව ද පළාත් මට්ටමේ පාපන්දු තරගාවලිය වව්නියාවේ දී පැවැත් වූ අතර එම තරගාවලියේ දි කිලිනොච්චි දිස්ත්‍රික් කාන්තා කණ්ඩායම ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී. මෙම කිලිනොච්චි දිස්ත්‍රික් කාන්තා කණ්ඩායම උතුරු පළාත් නියෝජනය කරමින් ජාතික මට්ටමින් ක්‍රීඩා කර අර්ධ පූර්ව වටයට යෑම සඳහන් කළ යුතු වැදගත් කරුණකි.

පළාත් මට්ටමෙන් වේගයෙන් ඇවිදීම , මැරතන් , ක්‍රිකට් තරගාවලිය කිලිනොච්චි මධ්‍යම විදුහල හා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වුණි මෙම තරගාවලියේ දී ප්‍රධාන අමුත්තා ලෙස කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්තුමිය වන රූපාවතී කේතීශ්වරන් මිය සහභාගි වන ලදී මෙම තරගාවලියේ දී කිලිනොච්චි කාන්තා ක්‍රිකට් කණ්ඩායම දෙවන ස්ථානය ලබා ගන්නා ලදී තව ද පිරිමි හා කාන්තා මැරතන් තරගවලදී ද තුන්වන ස්ථාන ලැබූ අතර වේගයෙන් ඇවිදීමේ තරගයේ දීද තුන්වන ස්ථානය ලබා ගන්නා ලදී.

පළාත් මට්ටමේ කරාටේ තරගාවලිය යාපනයේ දී පැවැත්වුණි. මෙම තරගවල දී කිලිනොච්චි දිස්ත්‍රික් කාන්තා කණ්ඩායම උතුරු පළාතේ ප්‍රථම ස්ථානයට පත් වූ අතර පිරිමි අංශයෙන් රිදී පදක්කම් 02 ක් ද ලෝකඩ පදක්කම් 03 ක් ද ලබා ගන්නා ලදී ජුනි මස 16 වන දින සිට 21 වන දින දක්වා ජාතික තරගාවලියට තේරී පත් වූ ක්‍රිකට් කණ්ඩායම් සඳහා වන ක්‍රීඩා කඳවුර උතුරු පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අනුග්‍රාහකත්වයෙන් කනගපුරම් ක්‍රීඩා පිටියේ දී පැවැත්වුණි. පළාත් මට්ටමේ එල්ලේ තරගාවලිය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දී කිලිනොච්චි මධ්‍යම විදුහල් ක්‍රීඩාංගණයේ දී පිරිමින් සඳහා ද ධර්මපුරම් මහජන ක්‍රීඩාංගණයේ දී කාන්තාවන් සඳහා ද විශිෂ්ට ලෙස පැවැත්වීම සඳහන් කළ යුතු කරුණකි.

පළාත් මට්ටමේ පැසිපන්දු හා දැල් පන්දු තරගාවලිය මන්නාරම දිස්ත්‍රික්කයේ දී පැවැත් වූ අතර එම තරග දෙකෙන් ම කාන්තා කණ්ඩායම දෙවන ස්ථානය ලැබූහ.

ජූලි මස 21 වන දා සිට 23 වන දා තෙක් කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රීඩා තරගාවලිය උත්කර්ෂවත් අයුරින් පැවැත් වූ අතර එම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස උතුරු පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ රාජා රණසිංහ මහතා සහභාගි වීම විශේෂයෙන් සඳහන් කළ හැකිය.

පළාත් මට්ටමේ ජූඩෝ තරගාවලිය කිලිනොච්චියේ දී පැවැත් වූ අතර කිලිනොච්චි කණ්ඩායම ප්‍රථම ස්ථානයට පත් වූ අතර එම කණ්ඩායම ජාතික මට්ටමට ද උතුරු පළාත නියෝජනය කරමින් සහභාගි වීම වැදගත් කරුණකි අගෝස්තු මස 01 හා 03 වන දින වල වවුනියා මහජන ක්‍රීඩාංගණයේ දී පැවති උතුරු පළාත් ක්‍රීඩා උත්සවයේ දී කිලිනොච්චි දිස්ත්‍රික්කය සහභාගි වී දක්ෂතා දැක් වූ අතර ලකුණු 51 ක් ලබා ඉතිහාසයෙන් ප්‍රථම වරට පළාතේ 04 වන ස්ථානයට පත් වෙන ලදී. මලල ක්‍රීඩාවලියේ දී වැඩි පදක්කම් සංඛ්‍යාවක් ලබා ගන්නා ලදී ජාතික ක්‍රීඩා උත්සවය සැප්තැම්බර් මාසයේ දී නාවලපිටියේ දී පැවැත් වූ අතර එහි දී කණිෂ්ට ජූඩෝ තරගාවලියට සහභාගි වූ කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රීඩිකාව තුන් වන ස්ථානය ලබා ගන්නා ලදී. පළාත් මට්ටමේ දී කිලිනොච්චි ක්‍රීඩක ක්‍රීඩිකාවන් තරග සඳහා දක්ෂ ලෙස සහභාගි වී ජයග්‍රාහනය ලැබූහ ජාතික මට්ටමේ පාසල් තරගාවලියේ දී මැරතන් තරගයේ දී කිලිනොච්චි දිස්ත්‍රිතික් ක්‍රීඩක ඇන්ටනී ඩෙල්මන් දෙවන ස්ථානය ලබා ගන්නා ලදී උතුරු පළාත් නියෝජනය කරමින් ජාතික පළාත් තරගාවලියට ජූඩෝ, පාපන්දු (කාන්තා) , ක්‍රිකට් (කාන්තා) , කරාටේ (කාන්තා) කණ්ඩායම් සහභාගි වීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි .

**කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රතිඵල ඉක්මනින් වැඩි වීම.**

2013 වසර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්‍රියාකාරකම් වල දී වැඩි ප්‍රවණතාවයක් ඇති වූ වසර ලෙස ගතහැකි කිලිනොච්චි දිස්ත්‍රික් ඉතිහාසයේ දී වැඩි ප්‍රමාණයෙන් ක්‍රීඩා කණ්ඩායම් පළාත් මට්ටමින් පැවැත්වූ තරග වලින් ජයග්‍රහනය කර ඇත තවද මෙම වසෙරේ දී මෙලෙස ජයගහනය කළ කණ්ඩායම් උතුරු පළාත නියෝජනය කරමින් ජාතික තරග වලට සහබාගී වීම තුළින් ඊළඟ අවුරුදු වලදී මෙම ප්‍රතිඵල තවත් බෙදී වැඩි වීමට සරිලන පරිසරය ඇති කර ඇත. තව ද මේ දක්වා උතුරු පළායේ ක්‍රීඩා ප්‍රතිඵලයෙන් පස්වෙනි තැන සිට මෙම අවුරුද්දේ ලකුණු 51ක් ගෙන 4 වන ස්ථානයට පැමිණීම වැදගත් කරුණකි.

## (උ) සංස්කෘතික දෙපාර්තමේන්තු කාර්ය සාදන වාර්තාව.

උතුරු පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව හරහා ඉටු කරන ලද කටයුතු පහත සදහන්වේ .

- දිස්ත්‍රික්කයේ වැදගත් පුද්ගලයින් අනුස්මරණය කිරිම සදහා ඒ 9 පාරේ ප්‍රධාන වටරවුම්වල පිළිරු ඉදිකිරීම සදහා වන අවසර මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදි.
- දිස්ත්‍රික්කයේ රාජකාරියේදී ඉටු කරන රජයේ සේවකයින් හා කලා සංගම් අතර කලාව එළි දැක්වීමේ තරග පවත්වන ලදි.
- ළමුන් වර්ධනය කිරීම සදහා ළමා කතන්දර වැඩසටහන් හදුන්වා දීම.
- පිළිරු පිහිටුවීම සදහා ස්ථාන සළකුණු කිරීම.
- ඔරලෝසු කණුව ඉදි කිරීමට අනුමැතිය ලබා ගැනීම සදහා මාර්ග සංවර්ධන දෙපාර්තෙමින්තුවට යැවීම.
- උතුරු පළාත් ගරු ආණ්ඩුකාර තුමාගේ සම්මාන කලාකරුවන් 4 දෙනකුට ලබා දීම.
- පාර්ලිමේන්තුවේ පවත්වන ලද නව රාත්‍රී උත්සවයට මෙම දිස්ත්‍රික්කයේ කිලි/ අම්බාල්කුලම් විවේකානන්දා විද්‍යාලයේ සිසුන්ගේ ඉදිරිපත් කිරීමට සංවිධානය කිරීම.
- උතුරු පළාත් සාහිත්‍ය උත්සවයට මෙම දිස්ත්‍රික් කලාකරුවන්ගේ වැඩසටහන් ඉදිරිපත් කිරීම

**සංස්කෘතික දෙපාර්තෙමින්තුවේ (මධ්‍යම රජයේ) හරහා ඉටු කරන ලද කටයුතු පහත සදහන් වේ.**

**ජාතික ආහාර සංස්කෘතික ප්‍රවර්ධන උත්සවය 2013**

සංස්කෘතික කටයුතු දෙපාර්තමින්තුවේ සංවිධානයෙන් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිංහල හින්දු අලුත් අවුරුද්ද උදෙසා ජාතික ආහාර සංස්කෘතික ප්‍රවර්ධන උත්සවය 2013 අප්‍රෙල් 5වන දින පස්වරු 3ට දිස්ත්‍රික් ලේකම් රූපවතී කේතීස්වරන් මැතිනියගේ ප්‍රධානත්වෙයන් පවත්වන ලදි. මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස යාපන දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි හා කාරකසභාවේ නියෝජ්‍ය සභාපති එම්. චන්ද්‍රකුමාර් මැතිතුමා සහභාගී වූවේ ය. එහි දී දේශනා කලා වැඩසටහන් හා අපේ රටට ආවේණික වූ පාරම්පරික ආහාර වර්ග පිළියෙල කිරීමේ ප්‍රායෝගික දැනුවත් කිරීම ද සිදු කරන ලදි.

## ජාතික කලා සාහිත්‍ය තරගමාලා 2013

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2013 වසෙරේ සාහිත්‍ය කලා උත්සවය සමග ම වාර්ෂිකව පැවැත්වෙන කලා සාහිත්‍ය තරගමාලා ප්‍රාදේශීය දිස්ත්‍රික් හා ජාතික වශෙයන් අදියර තුනකින් පවත්වන ලදි. ඒ අනුව මෙම තරගය පාසල් මට්ටමේ තරගය හා විවෘත අංශ තරග වශෙයන් පැවතුණි කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් දස දෙනෙක් ද කණ්ඩාවලෙලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් විසිඑක් දෙනක් ද පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් දෙදෙනක් ද පච්චිලෛපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් නම දෙනක් ද තෝරා ගත්හ.

ඔවුන් සදහා වන දිස්ත්‍රික් මට්ටමේ තරගයේ දී පළෙවනි දෙවනි තුන්වෙනි ස්ථාන කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් අට දෙනෙක් ද කණ්ඩාලෛ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් එකොළොස්දෙනෙක් ද පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් දෙදෙනක් ද පච්චිලෛපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් තරගකරුවන් හයදෙනෙක් ද තෝරා ගත්හ.

## රජයේ ළමා චිත්‍ර තරගය 2013

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් පැවැත්වෙන රජයේ ළමා චිත්‍රතරග මාලාව පළවෙනි වටය ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් පවත්වා දෙවනිවට තරගය දිස්ත්‍රික් මට්ටමෙන් කිලි/මධ්‍යම විදුහලේ දී 2013 ජූලි මස 9වන දින පෙරවරු 9ට දිසාපති රූපවති කේතීස්වරන් මැතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ අතර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ චිත්‍ර කණ්ඩායම මෙම උත්සවයට සහභාගි වීම විශේෂ දෙයකි. මෙම දෙවනිවට තරගයට සිසුන් 150 දෙනෙක් සහභාගි වූහ.

## (ඉ) සමාජ සේවා

**01.** අ. මහජන මාසික දීමනා

මෙම දීමනාව ඉතා දුප්පත් තත්ත්වයේ පසුවන පවුල්වලට ඔවුන් ජීවත් වන ප්‍රදේශයේ උප තැපැල් කාර්යාලය හරහා පහත සදහන් කරන ආකාරයට ලබා දෙනු ලබයි.

- එක් සාමාජිකයෙක් සිටින පවුලකට රු 250ක් වශයෙන් ද
- සාමාජිකයන් දෙදෙනෙක් සිටින පවුලකට රු 300ක් වශයෙන් ද
- සාමාජිකයින් තුන්දෙනෙක් සිටින පවුලකට රු 350ක් වශයෙන් ද
- සාමාජිකයින් හතරදෙනෙක් සිටින පවුලකට රු 400ක් වශයෙන් ද
- සාමාජිකයින් පස්දෙනෙක් සිටින පවුලකට රු 450ක් වශයෙන් ද
- සාමාජිකයින් 6 හෝ ඊට වැඩිදෙනෙක් සිටින පවුලකට රු 500ක් වශයෙන් ද ලබා දෙනු ලබයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස විසින් ලබා දුන් දීමනා විස්තර.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෙච්චි | **13,920,000** | **3350** |
| කණ්ඩාවලෙ | **7,800,000** | **2063** |
| පච්චිලෙප්පල්ලි | **3,000,000** | **851** |
| පූනහරි | **6,000,000** | **1624** |

## (ආ) රෝග සහනාධාර දීමනා

**1.ක්ෂය රෝගියෙක් සදහා රු 300ක් ලබා දෙනු ලබයි.**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස විසින් ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෙච්චි | **2600** | **07** |
| කණ්ඩාවලෙ | **600** | **02** |
| පච්චිලෙප්පල්ලි | **300** | **01** |
| පූනහරි | **3300** | **07** |

## 11)පිලිකා රෝගය

රෝගියෙක් සදහා රු. 500ක් ලබා දෙනු ලබයි ඔවුන් ජීවත් වන ප්‍රාදේශයේ උප තැපැල් කාර්යාලය හරහා ගෙවීම් කරනුලබයි .

ප්රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් 2013 ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෛච්චි | 37200 | **75** |
| කණ්ඩාවලෛ | 16000 | **32** |
| පච්චිලෛප්පල්ලි | 6500 | 13 |
| පූනහරි | 8000 | 16 |

## 111)වකුගඩු රෝගය

රෝගියෙක් සදහා රු 500ක් ලබා දෙනු ලබයි ඔවුන් ජීවත් වන ප්‍රාදේශයේ උප තැපැල් කාර්යාලය හරහා ගෙවීම් කරනුලබයි .

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශෙයන් 2013 ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෛච්චි | **-** | **11** |
| කණ්ඩාවලෛ | **-** | **02** |
| පච්චිලෛප්පල්ලි | **-** | **-** |
| පූනහරි | **-** | **-** |

## 02)වැඩිහිටි පුරවැසියන් සදහා දීමනා

අවුරුදූ 70ට වැඩි ජේෂ්ඨ පුරවැසියන් සදහා දීමනාවක් වශෙයන්1000ක් ඔවුන් ජීවත් වන ප්‍රදේශයේ උප තැපැල් කාර්යාලය හරහා ගෙවීම් කරනුලබයි .

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් 2013 ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෛච්චි | 1186000 | 1186 |
| කණ්ඩාවලෛ | 453000 | 453 |
| පච්චිලෛප්පල්ලි | 206000 | 206 |
| පූනහරි | 357000 | 357 |

03ආබාධ සහිත පුද්ගලයන් සඳහා දීමනා

මහින්ද චින්තනය යටතේ දුප්පත් තත්ත්වයෙන් සිටින ආබාධිත පුද්ගලයින් ගෘහ මූලිකයෙක් නම් එක් ප්‍රතිලාභීන්ට රු 3000ක් බැගින් පහත සදහන් අයුරින් ලබා දෙනු ලබයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් 2013 ලබා දුන් දීමනා විස්තර

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෛච්චි | 150000 | 50 |
| කණ්ඩාවලෛ | 150000 | 50 |
| පච්චිලෛප්පල්ලි | 150000 | 50 |
| පූනහරි | 150000 | 50 |

04. ස්වයංරැකියා දීමනා

යුනිසෙෆ් වැඩසටහන් යටතේ පාසල් යන සිසුන් සිටින හා පවුල් සාමාජිකයන් වැඩි ස්වයං රැකියා කළ හැකි පවුල්වලට අදාළ දීමනා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා චෙක්පත් මගින් ලබා දෙනු ලබයි .

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් 2013 ලබා දුන් දීමනා විස්තර.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෛච්චි | 432000 | 12 |
| කණ්ඩාවලෛ | 72000 | 02 |
| පච්චිලෛප්පල්ලි | - | - |
| පූනහරි | 644000 | 18 |

## 05. ගෘහ මූලිකයක් වශයෙන් එක් පුද්ගලයෙක් සිටින පවුල් සඳහා ස්වයංරැකියා දීමනා

**දෙමාපියන්ගෙන් එක් කෙනෙක් සිටින (ස්වාමිපුරුෂයා හෝ බිරිඳ නැති පවුල් සඳහා ස්වයං රැකියා සහනාධාර වශයෙන් ප්‍රතිලාභියෙකුට රු 15000ක් බැගින් ලබා දෙනු ලබයි .**

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් 2013 ලබා දුන් දීමනා විස්තර.**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෙච්චි | 80000 | 08 |
| කණ්ඩාවලෛ | 300000 | 20 |
| පච්චිලෛප්පල්ලි | 80000 | 08 |
| පූනහරි | 80000 | 08 |

## 06. ආබාධිත පුද්ගලයින් සමාජ මට්ටමේ ශක්තිමත් කිරීමේ වැඩසටහන්

**සමාජ මට්ටමේ සිටින ආබාධිතයන් හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතා හෙලිකරගෙන කටයුතු කිරීම සඳහා වන වැඩමුලුව සිදු කරන ලදි.**

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් 2013 ලබා දුන් දීමනා විස්තර**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන |
|---|---|
| කරෙච්චි | 20000 |
| කණ්ඩාවලෛ | 20000 |
| පච්චිලෛප්පල්ලි | 20000 |
| පූනහරි | 20000 |

**07.හදිසි ආපදා සහනාධාර (නිවාස හානි ) 2013**

**ස්වභාවික ආපදාවලින් ඇති වන නිවාස හානි සඳහා වූ සහනාධාර වශයෙන් රු 20000ක් බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා චෙක්පත් මගින් ලබා දෙනු ලබයි.**

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිපාදන | ප්‍රතිලාභීන් |
|---|---|---|
| කරෙච්චි | 240000 | 14 |
| කණ්ඩාවලෙ | 120000 | 06 |
| පච්චිලෛප්පල්ලි | 40000 | 02 |
| පූනහරි | 280000 | 16 |

**08. දිස්ත්‍රික් සමාජ සේවා කාර්යාලය ගොඩනැගිලි ඉදිකිරිම අදියර 2 සඳහා රු.2000000 වෙන් කර වියදම් කර ඇත.**

**09. කණ්ඩාවලෙ සාමාජ සුබසාදන මධ්‍යස්ථානයට රු.2900000 වෙන් කර වියදම් කර ඇත.**

## 5.3.සංවර්ධන කටයුතු

